සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

### 7 - ශ්‍රේණිය

### පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය :- ................................................................ කාලය: පැය 02යි.

I පත්‍රය

- සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) න්‍යෂ්ටික පවුලකට අයත් වන සාමාජිකයින් ඇතුළත් වන පිළිතුර තෝරන්න.
(1) මව , පියා , දරුවන් හා මව් පාර්ශවයේ ඥාතීන්
(2) මව, පියා , දරුවන් හා පිය පාර්ශවයේ ඥාතීන්
(3) මව, පියා හා දරුවන්
(4) මව, පියා , දරුවන් හා දෙපාර්ශවයේ ම ඥාතීන්

(02) වර්තමානයේ පුද්ගලයෙකු සුවිශේෂීව හඳුනා ගැනීම සඳහා භාවිතා කරනු ලබන පරීක්ෂණය වන්නේ,
(1) DNA පරීක්ෂණය
(2) X කිරණ පරීක්ෂණය
(3) MRI පරීක්ෂණය
(4) ECG පරීක්ෂණය

(03) භාණ්ඩයක් මිල දී ගැනීමේ දී බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස ඔබ වඩාත් ම අවධානය යොමු කළ යුතු කරුණු වන්නේ,
(1) භාණ්ඩයේ ඇසුරුම හා අඩංගු ද්‍රව්‍ය
(2) භාණ්ඩයේ මිල හා ඇසුරුම
(3) භාණ්ඩයේ මිල හා ගුණාත්මකභාවය
(4) භාණ්ඩයේ ඇසුරුම හා ඉල්ලුම

(04) අපට තොරතුරු ලබාගත හැකි විද්‍යුත් මාධ්‍ය දෙකකි.
(1) පුවත්පත් හා ගුවන්විදුලිය
(2) ගුවන් විදුලිය හා රූපවාහිනිය
(3) අන්තර්ජාලය හා පුවත්පත්
(4) පුවත්පත් හා සඟරා

(05) ඥාතිත්වය අනුව පියාගේ මල්ලී ඔබගේ කවුරුන් ද?
(1) මහප්පා
(2) මාමා
(3) ඥාති සහෝදරයා
(4) බාප්පා

(ලකුණු 02 × 5 = 10)

- පහත සඳහන් ප්‍රකාශවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(06) ළමා වියේ දී ම ඔබ සාමාජිකත්වය ලබන ජීවිතයට ඉතා වැදගත් ආයතනයක් ලෙස ........................................ හැඳින්විය හැකි ය. (පවුල / පාසල)

(07) සිත තුළ විවිධ චිත්තවේගීය තත්වයන් ඇති වූ විට ........................................ ඉරියව්වලින් හඳුනාගත හැකි ය. (මුහුණෙහි / සිතෙහි)

(08) වෙළෙඳපොළෙහි භාණ්ඩයක මිල ඉහළ යනවිට ඒ සඳහා ........................................ භාණ්ඩ පරිභෝජනය කළ හැකි ය. (මිල අඩු / ආදේශක)

(09) එක් පරම්පරාවකින් තවත් පරම්පරාවක් වෙත සංස්කෘතිය පවරා දෙමින් සිදුකරනු ලබන මූලික ම ඒකකය .......................................... යි. (පවුල / පාසල)

(10) ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය .......................................... රජු භාවිත කරන ලද රාජකීය කොඩිය ඇසුරින් නිමකර ඇත. (ශ්‍රී වික්‍රමරාජසිංහ / දෙවන රාජසිංහ)

(ලකුණු 2 × 5 = 10)

- පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ සඳහන් කරන්න.

(11) සිරිත් මල්දම අතීතයේ සිටම සාරධර්ම පිළිපැදීමේ වැදගත්කම පෙන්වා දී ඇති කෘතියකි. ( )

(12) පත්පන්දු ක්‍රීඩාව ලොවට හඳුන්වාදීමේ ගෞරවය රොබට් වෝල්ටර් මහතාට හිමි වේ. ( )

(13) චිත්‍ර ඇඳීම විවේක කාලය ගත කිරීම සඳහා යොදාගත හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකමකි. ( )

(14) පොත්පත් කියවීම නිසා අයහපත් චිත්තවේගීය තත්වයන් පාලනය කරගත නොහැකි ය. ( )

(15) දෙමාපියන්ට සැලකීම අපෙන් ඉටුවිය යුතු නීතිමය යුතුකමකි. ( )

(ලකුණු 2 × 5 = 10)

- පහත I තීරුවේ දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ වන පදය II තීරුවෙන් තෝරා යා කරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| (16) මිනිසුන්ගේ හැසිරීම් සිරිත් විරිත් | A අභියෝග |
| (17) විනය ගරුක බව, අවංකබව | B සේවා |
| (18) විරැකියාව, අපචාර බහුල වීම | C අරමුණු |
| (19) අධ්‍යාපනය, ප්‍රවාහනය | D සාරධර්ම |
| (20) විභාග සමත්වීම, රැකියාවක් ලබා ගැනීම | E චිත්තවේග |
| | F සංස්කෘතිය |

(ලකුණු 2 × 5 = 10)

<u>II පත්‍රය</u>

- **ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (1) පවුල තුළින් ඔබට ලැබෙන අයිතිවාසිකම් තුනක් ලියන්න. (ලකුණු 03)

(2) ඔබෙන් පවුලට ඉටුවිය යුතු යුතුකම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) වර්තමාන පවුල් ඒකක මුහුණපාන අභියෝග දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(02) (1) ක්‍රීඩාවල යෙදීමෙන් වර්ධනය වන ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)

(2) විවේකය ඵලදායි ලෙස ගත කිරීම සඳහා යොදාගත හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් හතරක් දක්වන්න. (ලකුණු 04)

(3) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීම නිසා ඔබට ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (1) ශ්‍රී ලාංකික ජන සමාජය තුළ ජීවත්වන ප්‍රධාන ජන වර්ග තුන නම් කරන්න. (ලකුණු 03)

(2) පහත සඳහන් උත්සව කවර ආගම්වලට අයත්දැයි ලියන්න.

A - හජ්ජි උත්සවය

B - වෙසක් උත්සවය

C - තෛපොංගල් උත්සවය

D - නත්තල් උත්සවය

(ලකුණු 04)

(3) සමාජ සහපැවැත්ම සඳහා පුද්ගලයකු විසින් පිළිපැදිය යුතු සාරධර්ම දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (1) වර්තමාන සමාජයේ බොහෝ සමාජිකයන් මුහුණ දෙන අභියෝගාත්මක අවස්ථා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට වර්ධනය කරගත යුතු ගුණාංග හතරක් ලියන්න. (ලකුණු 04)

(3) අභියෝග ජය ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (1) පුද්ගලයන් තුළ දක්නට ලැබෙන දුර්වල ගති ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(2) යහපත් ගති ලක්ෂණ ඇතිකර ගැනීම නිසා ඔබට ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් දක්වන්න. (ලකුණු 04)

(3) මත්ද්‍රව්‍ය, දුම්වැටි භාවිතය නිසා පුද්ගලයෙකුට ඇති විය හැකි ගැටලු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (1) ශ්‍රී ලංකා ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) ශ්‍රී ලංකා ජාතික කොඩියේ පහත දක්වා ඇති සංකේතවලින් නිරූපණය වන්නේ මොනවාදැයි දක්වන්න.

A - කහ පැහැති සිංහයා

B - පිටකොන බෝපත් සතර

C - තද රතු පාට පසුබිම

D - කොළ පැහැති තීරුව

(ලකුණු 04)

(3) A - ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය නම් කරන්න. (ලකුණු 02)

B - එය තෝරා ගැනීමට හේතු වූ කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(07) (1) ඔබේ පවුලේ සාමාජිකයින් අතර සම්බන්ධතා පවත්වන ආකාර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) සමාජය තුළ ජීවත්වන විට අසල්වාසීන් සමඟ සුහදව කටයුතු කරන අවස්ථා හතරක් ලියන්න. (ලකුණු 04)

(3) ජන සමාජයේ යහපත් පුරවැසියෙකු ලෙස ජීවත්වීම සඳහා ප්‍රගුණ කළ යුතු උතුම් ගුණාංග දෙකක් සඳහන් කර එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)